**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**සමාන්‍ය පාඩම් - 12 පාඩම**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | III | 7.4.1. ඊජිප්තු මූර්ති හා චිත්‍ර නිර්මාණ |

- නයිල් ගංගාධාරය පදනම් ව ව්‍යාප්ත වූ ලෝකයේ ඉපැරණි ම ශිෂ්ටාචාරයක් වන ඊජිප්තු ශිෂ්ටාචාරය ක්‍රි.පූ. 3000 - 30 අතර කාල පරාසයට අයත් වේ.
- ඊජිප්තුව පාරාවරුන්ගේ බල පරාක්‍රමය ලොවට කියාපාන සුවිශාල පිරමීඩ, ගෘහ නිර්මාණ, චිත්‍ර මූර්ති ආදී කලා නිර්මාණ සඳහා පදනම වූයේ ඔවුන් දැඩි ලෙස විශ්වාස කළ මරණින් මතු ආත්මය පිළිබඳ සංකල්පයයි.
- අමර්ණා, ගීසා සහ තීබ්ස් යන නගර ආශ්‍රිතව ඊජිප්තු නිර්මාණ රැසක් හමුවේ.
  - ✓ **ඊජිප්තු මූර්ති** – ස්පින්ක්ස්, ලියන්නා හෙවත් ලේඛකයා, නෙෆර්ටිටි
  - ✓ **ඊජිප්තු චිත්‍ර -** මීඩම්හි පාත්තයෝ, කුරුළු දඩයම

## <u>ස්පින්ක්ස්</u>

- ක්‍රි.පූ. 2440 ට පමණ අයත් ස්පින්ක්ස් මූර්තිය කුෆු පිරමීඩය ඉදිරිපිට පිහිටි උසින් අඩි 66ක් හා පළලින් අඩි 240ක් වන ඉපැරණි මූර්තියක් ලෙස හඳුන්වා දිය හැකි ය.
- ඊජිප්තු කලාවේ ස්පින්ක්ස් මූර්ති රැසක් හමුවූවත් ප්‍රධාන පිරමීඩය අසල හමුවන මහා ස්පින්ක්ස් නම් මූර්තිය සුවිශේෂී ය. මිනිස් මුහුණ සමග සත්ත්ව ශරීරය (සිංහ) එකට බද්ධ කිරීමෙන් සැකසුණු මෙම නිර්මාණය ඊජිප්තු කලාවේ කල්පිත මූර්ති සඳහා දිය හැකි කදිම නිදසුනකි.
- ස්පින්ක්ස් නිර්මාණය පාරාවරුන්ගේ තෙදබලපරාක්‍රමය මෙන් ම ආරක්ෂාව පිළිබඳ සංකල්පය නිරූපණය කරන බව විචාරක මතය.

### <u>ක්‍රියාකාරකම</u>

පහත මූර්තිය 2ක හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න

- •හඳුනාගත් බව : ……………………
- •යුගය : ……………………
- •කාලය : ……………………
- •මාධ්‍ය : ……………………
- •ශිල්ප ක්‍රමය : ……………………
- •කලාත්මක ලක්ෂණ: ……………………





### <u>ඇගයීම</u>

පහත දක්වා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

01) ඊජිප්තුවෙන් හමුවූ මූර්ති හා සිතුවම් නම් කරන්න

02) ඊජිප්තු කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම පිළිබඳ විස්තර කරන්න

03) මෙහි නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරන්න

04) ඊජිප්තු කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරන්න